# අම්පාර රජගල පුරවිද්‍යා භූමියෙන් හමු වූ මූල බ්‍රාහ්මීය ලිපි පිළිබඳ අධ්‍යයනයක්

එන්.ඒ. සදිනි මනරංගි දයානන්ද[20]

---

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජගල ආරාමය ලජ්ජිතිස්ස රාජ්‍ය (ක්‍රි.පු. 119-109) සමයේ කරන ලද ගොඩනැගිලි ආරාම සංකීර්ණයක් ලෙස පිළිගැනේ. ශිලා ලේඛන සහ සාහිත්‍ය මූලාශ්‍ර සාධක අනුව අතීතයේ දී මෙම විහාරය **ගිරිකුම්බිලතිස්ස පවත, කුබලවතිස පවත, චනතිසපවත, අරිත්තාරා වෙහෙර, අරියාකර විහාරය, රචකලකුබලවතිස පවත, රාස්සහෙල** නාමයන්ගෙන් හඳුන්වා ඇත. 1933 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රජගල ආරාම භූමියෙහි කරන ලද පර්යේෂණ මගින් අනුරාධපුර යුගයට අයත් අභිලේඛන 80කට ආසන්න ප්‍රමාණයක් සොයා ගෙන ඇත. ඒ අතුරින් ලෙන් ලිපි 58ක් ද ගිරි ලිපි 20ක් ද ටැම් ලිපි 2ක් ද පුවරු ලිපි 3ක් ද යනුවෙන් වර්ග කර දැක්විය හැකි ය. මෙම ලිපිය මගින් මූල බ්‍රාහ්මී ශිලා ලේඛන පමණක් අධ්‍යනය කරනු ලැබේ. රජගලතැන්නේ මූල බ්‍රාහ්මීය ලේඛන ලෙන් ලිපි හා ගිරි ලිපි වශයෙන් කොටස් දෙකකි. මෙම ලිපි අතුරින් ඇතැම් ලිපි ප්‍රකාශයට පත් කොට තිබෙන අතර තවත් ලිපි කිහිපයක් මෑතකදී කරන ලද ගවේෂණ වලින් සොයා ගනු ලැබ ඇත. රජගල ලිපි අතර මිහිඳු මහරහතන් වහන්සේගේ සහ උත්තිය තෙරුන්ගේ ධාතු නිධන් කර තැනූ දාගැබක් පිළිබඳව සඳහන් වීම විශේෂ කරුණකි. මෙම ලිපි වලින් අදින් වසර 2000කට පෙර නැගෙනහිර කලාපයේ දේශපාලනික වශයෙන් රජවරු (මහරජහ), බිසෝවරු (බුතදතය, යසස්සිනිය), යුවරජවරු (අය අබය) ලෙස ද, ආගමික වශයෙන් භික්ෂු (ශිව තෙරශ), පූජකවරු (අශ ගුතහ), උපාසක (උපසක දතශ), උපාසික (උපශික ශමිකය) ලෙස ද, සමාජීය වශයෙන් අයකැමි, පරුමක, භර්තෘ, දිසාචේවරු ලෙස ද, සංස්කෘතික වශයෙන් වසරක් පාසා පවත්වන අරියවශ සූත්‍ර දේශනාව, කර්මාන්තය හා කෘෂිකර්මාන්තය යනා දී කරුණු රාශියක් අනාවරණය කළ ගැනීමට හැකියාව ලැබීම විශේෂත්වයකි. මෙහි ඇති ශිලා ලිපි ක්‍රිස්තු පූර්ව 1-3 සියවස් වලට අයත් මූල බ්‍රාහ්මීය අක්ෂර වලින් යුක්ත ය. මෙම ලෙන් ලිපි තනි පේළියකින් හා පේළි දෙකකින් යුක්ත වන අතර ගිරි ලිපි ද පේළි කිහිපයකින් යුතු බව හඳුනාගත හැකි ව තිබේ. මෙම ලිපි අධ්‍යයනයෙන් සමකාලීන සමාජයේ පැවති භාෂාව හා අක්ෂර රූපවල විකාශන ලක්ෂණයන් පැහැදිලි ව හඳුනාගත හැකිවන අතර. සමාජ සංස්කෘතික දේහයේ හැඩගැස්ම පිළිබඳ ව ද සාධනීය කරුණු අනාවරණය කරගැනීමට හැකි ව තිබේ. විශේෂයෙන් ඓතිහාසික රුහුණු පුරවරයේ ජනාවාස ව්‍යාපත්තිය හා ඒ හා බැඳුණු සංස්කෘතික හැඩගැස්ම කෙසේ ද යන්න පිළිබඳ නිසි ලෙස වටහා ගැනීමට මෙ මඟින් හැකියාවක් ඇත.

ප්‍රමුඛ පදඃ ලෙන, ආරාමය, ලිපි

---

[20] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, Sadinimanarangi@yahoo.com.